දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784811

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

මගේ අංකය / எமது இல. / My No. } ED/01/12/02/06/02

දිනය / திகதி / Date } 2010.08.26

# චක්‍රලේඛ අංක 2010/27

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු
පාසල් ප්‍රධානීන් වෙත

## ද්විතියික ශ්‍රේණි (6 – 11) සඳහා විෂයමාලාව ක්‍රියාත්මක කිරීම.

ද්විතියික ශ්‍රේණි (6 – 11) සඳහා විෂයමාලා ක්‍රියාත්මක කිරීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2006.03.07 දිනැති අංක 2006/09 චක්‍රලේඛය සහ 2007.03.07 දිනැති අංක 2007/06, 2008.04.21 දිනැති අංක 2008/12 හා 2008.09.15 දිනැති අංක 2008/12(1) චක්‍රලේඛ සංශෝධනවලට අමතරව මෙම චක්‍රලේඛ සංශෝධනය ද මින් ඉදිරියට බල පැවැත්වේ.

## ද්විතියික ශ්‍රේණිවල ක්‍රියාත්මක ද්වි භාෂා අධ්‍යාපන වැඩසටහන්

ද්වි භාෂා අධ්‍යාපන වැඩසටහනට අදාළ වන 2008/12 හා 2008/12(1) චක්‍රලේඛ විධි විධානවලට ඔබගේ අවධානය යොමු කරවන අතර, පහත සඳහන් විධි විධාන ද මින් ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු බව දැනුම් දෙමි.

02. 2008/12 චක්‍රලේඛයේ 4.3 ඡේදයෙන් දැක්වෙන පරිදි තෝරා ගත් විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනීම සඳහා තෝරා ගත යුත්තේ පාසලේ හයවන ශ්‍රේණයේ සිසුන් අතුරිනි. පාසලට ඇතුළත්වීම සඳහා ද්වි මාධ්‍ය පන්තිය උපයෝගී කර ගැනීමට ඉඩකඩ නොදිය යුතුය.

03. මෙම අමාත්‍යාංශය මගින් යොමු කරනු ලබන ශිෂ්‍යත්වධාරීන් ඇතුළුව හයවන ශ්‍රේණියේ සිටින සිසුන් අතරින් පමණක් ද්වි භාෂා වැඩසටහන සඳහා සිසුන් තෝරා ගත යුතුය. එසේම ද්වි භාෂා සිසුන් වශයෙන් ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී ද අදාළ පාසලට ඇතුළත් කර ගැනීම සඳහා තීරණය වූ ශිෂ්‍යත්ව ලකුණට වඩා අඩු ලකුණු සහිත සිසුන් හා ශිෂ්‍යත්ව විභාගයට පෙනී නොසිටි සිසුන් තරඟ විභාගයක් පවත්වා හෝ නොපවත්වා ද්වි භාෂා සිසුන් ලෙස ඇතුළත් කර නොගත යුතු බව අවධාරණය කරමි.

04. හත්වන ශ්‍රේණිය සඳහා ද්වි භාෂා සිසුන් ලෙස වෙනත් පාසල්වල ද්වි භාෂා නොවන සිසුන් ඇතුළත් කර නොගත යුතුය. ද්වි භාෂා සිසුන් වුව ද ඇතුළත් කර ගත හැක්කේ අදාළ දරුවාගේ දෙමාපියන් ස්ථාන මාරුවීම් ලැබ

හෝ පෞද්ගලික හේතුන් මත හෝ තම පදිංචි ස්ථානය ඉල්ලුම් කරන අදාළ පාසල ඇති ප්‍රදේශයට වෙනස් කරන්නෝ නම් පමණි.

05. ද්වි භාෂා අධ්‍යාපන වැඩසටහන සම්බන්ධීකරණය සඳහා පළාත් හා කලාප මට්ටමින් ද්වි භාෂා අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරීන් සිටින අතර, ඔවුන්ගේ සහාය ඇතිව මෙම චක්‍රලේඛය හා මීට අදාළ අනෙකුත් චක්‍රලේඛවල විධි විධානයන් පාසල්වල නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ දැයි සොයා බැලීම හා එසේ නොවන අවස්ථාවල දී සුදුසු පියවර ගැනීම පළාත් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වග බලා ගත යුතුය.

සුනිල් එස්. සිරිසේන
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් –

1. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති
4. විභාග කොමසාරිස් ජනරාල්
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
6. විගණකාධිපති
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්
8. රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන්